# සංස්කෘත ව්‍යාකරණ සාහිත්‍යය

ශ්‍රාවස්තිපුර ශාන්තසිරි හිමි

Sanskrit grammar is a unique invention of the Vedic Aryans, that reached much development thereafter. Today it has grown into an important discipline that needs to be studied separately as a special field of Sanskrit literature. The science of grammar is also known by the synonyms Ś*abd*ā*nu*ś*ā*s*ana* and Ś*abda*śā*stra*, and in order to highlight its vastness and depth, it is also designated as Ś*abdav*ā*rida*. The Sanskrit grammatical literature that dates back to the beginning of formal Vedic studies, inherits an history of nearly Three millennia. It is rich with unknown works of grammarians like Śākaṭāyana and Gārgya and the existing works such as Yāska's *Nirukta*, *Padap*ā*ṭha* of Śākalya, *Ṛgveda-prātiśkhya* and *Uṇādis*ū*tra*. It also includes in its fold the *Ved*āṅ*ga*s of Ś*ikṣā*, *Kalpa* and *Vy*ā*karaṇa* for their contribution to the preservation and the correct use of the *Veda*s. The Sanskrit grammatical literature is adorned with the *Aṣṭādhy*ā*y*ī of Pāṇini composed in the 4th century B.C. and acclaimed by the linguists of the 20th century as 'the greatest monument of human intelligence'. The purpose of this study is to make a basic investigation into Sanskrit grammar that developed through *vṛtti*s and *bh*ā*ṣya*s and various other branches of grammatical tradition. This study will be conducted using primary and secondary sources and investigating into the definitions of grammar, history of grammar, its development and basic uses, division of grammatical literature into different periods, *Trimuni-vy*ā*karaṇa* or the *Aṣṭādhy*ā*y*ī tradition, the independent traditions outside that great tradition and the *S*ā*rasvata*.

## 1. ව්‍යාකරණ නිර්වචනය

ව්‍යාකරණ යන්න '√කෘ (- ඩුකෘඤ් - කරණෙ[1]) අටවැනි තනාදි ගණික උභයපදී 'කිරීම' යන අර්ථය ඇති ධාතුවට පූර්වයෙන් 'වි , ආ' යන උපසර්ග යෙදී නිෂ්පන්න කෘදන්ත පදයකි.[2] ශබ්දානුශාසන, ශබ්දශාස්ත්‍ර යනු ව්‍යාකරණ යන්නට පර්යාය වේ. ශබ්දාර්ථ දෙකේ විශිෂ්ට අවබෝධය ලබාදෙන ශාස්ත්‍රය ව්‍යාකරණය යි (ව්‍යාකරණං නාම ශබ්දාර්ථව්‍යුත්පත්තිකරං ශාස්ත්‍රම්[3]). යමක් කරණ කොටගෙන ශබ්දයෝ අර්ථවත් පරිද්දෙන් ප්‍රකාශ කරනු ලැබෙද්ද, නිපදවනු ලැබෙද්ද, එළවනු ලැබෙද්ද ඒ වනාහි ව්‍යාකරණය යි (ව්‍යාක්‍රියන්තෙ ව්‍යුත්පාද්‍යන්තෙ අර්ථවත්තයා ප්‍රතිපාද්‍යන්තෙ ශබ්දා යෙන[4]).

ශබ්දශාස්ත්‍රය හෙවත් සංස්කෘත ව්‍යාකරණය වූකලී ඉතා සංකීර්ණ, පෘථුල විෂයයකි. ''අනන්තපාරං කිල ශබ්දශාස්ත්‍රම්''[5] ව්‍යාකරණය හැදෑරීමට වර්ෂ දොළහක් ගත වේ. ''ද්වාදශභිර් වර්ෂෛර්ව්‍යාකරණං ශ්‍රූයතේ.''[6] ''මේ ව්‍යාකරණ ශාස්ත්‍රය ආත්මාර්ථ - පරාර්ථ සාධනයෙහි තත්පර වූ සකල සාධු ජනයන් විසින් මහෝත්සාහයෙන් නිතර භාවිත, බහුලීකරණ, උද්ග්‍රහණ, ධාරණ, පරිචින්තන, පරිප්‍රශ්න, පරිශීලනාදිය''[7] කළ යුතු විෂයයකි. නිරුක්තිය හෙවත් ව්‍යාකරණය පිළිබඳ දැනුමෙන් තොර ව ත්‍රිපිටක බුද්ධවචනයෙහි ද නිරවද්‍ය අර්ථෝද්ග්‍රහණය කළ නොහැකි බැව් පාළි ව්‍යාකරණ සාහිත්‍යයෙහි ද සඳහන් වෙයි.

''යො නිරුත්තිං නසික්ඛෙය්‍ය - සික්ඛන්තො පිටකත්තයං

පදේ පදේ විකංඛෙය්‍ය - වනේ අන්ධ ගජො යථා''[8]

ඒ අනුව ව්‍යාකරණය වනාහි ලොව ඇති සියලු ශිල්ප සහ ශාස්ත්‍ර අවබෝධයට පදනම වන එසේ ම ලෝකෝත්තර අර්ථාවබෝධය පිණිස පවා ඉවහල් වන ශාස්ත්‍රය යි.

## 2. ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි ආරම්භය හා උපයෝගීතාව

සංස්කෘත ව්‍යාකරණ අධ්‍යයනය ක්‍රමවත් වීම ඇරඹෙනුයේ ශාකලයන් ඍග්වේදයට සැකසූ පදපාඨයෙනි යනු ජේ. තිලකසිරිගේ අදහස යි.[9] වාක්‍ය, නාම පද, සමාස පද ආදිය විග්‍රහ කිරීම පදපාඨයෙන් සිදු වේ. ඒ හැරුණු විට 'ප්‍රාතිශාඛ්‍ය' කෘතීන්හි අන්තර්ගත "ශික්ෂා" නම් සූත්‍ර විශේෂයෙන් ද ව්‍යාකරණමය කරුණු විස්තෘත ය. මේ අනුව ව්‍යාකරණ ඉගෙනීමෙහි අරමුණ වූයේ වෛදික ග්‍රන්ථවල නිරවද්‍යතාව ආරක්ෂා කරගැනීම ය. ඍග්වේද සූක්තවල ඇති ඍචවල(ස්තුති ගීතිකාවල) සංහිතාපාඨ හා පදපාඨ සකස් කිරීම මෙහි පළමු උපයෝගිතාව හෙවත් කාර්යය විය.

ඍග්වේදයේ කිසිදු තැනක හමු නොවන, සාමවේදයේ ෂඩ්විංශ බ්‍රාහ්මණයේදී පළමු වරට හමු වන වේදාංග සය පිළිබඳ සඳහන[10] සකු වියරණය පිළිබඳ ආදිතම සටහන අප වෙත ලබාදෙයි. ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ත, ඡන්දස්, ජ්‍යොතිෂ ලෙසින් දැක්වෙන වේදාංගයෝ වේදාධ්‍යයනයේ දී මහෝපකාරී වන හෙයින් උක්ත

සංඥාව ලබති. මෙයින් ශික්‍ෂා, ව්‍යාකරණ සහ නිරුක්ත යන අංග විශේෂයෙන් ව්‍යාකරණය හා සබැඳි ය.

වේදාධ්‍යයනයේ දී අවශ්‍ය වූ උච්චාරණය, සන්ධි ගැළපීම, විභක්ති ප්‍රත්‍යය විභාගය ආදි කරුණු විග්‍රහය උදෙසා පළමු ව ව්‍යාකරණමය විමර්ශන ඇරඹිණි.[11]

යාස්කගේ "නිරුක්තිය" වියරණ සාහිත්‍යයේ පැරණිතම කෘතිය ලෙස හැඳින්වීමට සේනානායක කැමැති වෙයි.[13] භාෂා ප්‍රයෝගයේ ප්‍රභේද, වාක්‍ය වර්ග, නාම, සර්වනාම, ආඛ්‍යාත, උපසර්ග වැනි වියරණ අංග රැසක් පිළිබඳ යාස්කාචාරීහු සිය කෘතියෙහි විමසති.

කවිකල්පද්‍රැම නම් ධාතුකෝශය රචනා කරන වෝපදේවාචාර්යයෝ ඉපැරණි සංස්කෘත ව්‍යාකරණඥයන් අටදෙනෙකු පිළිබඳ ව සඳහන් කරති.

''ඉන්ද්‍රශ්චන්ද්‍රඃ කාශකෘත්ස්නා - පිශලීශාකටායනඃ

පාණිනා‍්‍යමරජෛනේන්ද්‍රා - ජයන්ත්‍යෂ්ටාදි ශාබ්දිකාඃ''[14]

ඉන්ද්‍ර, චන්ද්‍ර, කාශ, කෘත්ස්න, පිශලී, ශාකටායන, පාණිනි, අමර සහ ජෛනේන්ද්‍ර යනු එම අටදෙනා වෙති. මෙහි එන ඉන්ද්‍රාචාර්යයන් පිළිබඳ ව සාරස්වත ව්‍යාකරණයෙහි ද ''ඉන්ද්‍රාදයෝ'පි යස්‍යාන්තම් න යයුඃ ශබ්දවාරිදේඃ'' යන ලෙසින් සඳහන්වේ. එලෙසින් ම පාණිනි සිය කෘතියේ දී පූර්වකාලීන ව්‍යාකරණඥයන් සැට සතර දෙනෙකු පිළිබඳ ව සඳහන් කරයි.[15]

## 3. සංස්කෘත ව්‍යාකරණ සාහිත්‍යයේ යුග බෙදීම්

සංස්කෘත ව්‍යාකරණය විශාල කාල පරාසයක් පුරා අතිමහත් ග්‍රන්ථ සම්භාරයකින් යුතු ව වර්ධනය වූ වෙන ම සාහිත්‍යයකි. මේ අතිමහත් ග්‍රන්ථ සංඛ්‍යාව භාෂා පරිණාමය පිළිබඳ වාග්වේදීන්ගේ අදහස්[16] සහ ග්‍රන්ථාන්තරාගත තොරතුරු අනුව පහත පරිදි යුග තුනකට බෙදිය හැකි ය.

1. ප්‍රාක්තන යුගය - ක්‍රි. පූ. 1500 සිට ක්‍රි. පූ. 300 දක්වා ය. ශික්ෂා, නිරුක්ති ආදි වේදාංග හා පාණිනීගේ අෂ්ටාධ්‍යායී ව්‍යාකරණය ද මේ යුගයට අයත් වේ.
2. මධ්‍යතන යුගය - ක්‍රි. පූ. 300 සිට ක්‍රි. ව. 900 දක්වා ය. කාත්‍යායන වෘත්තිය, පතඤ්ජලී මහාභාෂ්‍යය, භර්තෘහරිගේ වාක්‍යපදීය, කාශිකාවෘත්ති, කාතන්ත්‍ර ආදිය මේ යුගයට අයත් වේ.
3. නූතන යුගය - ක්‍රි. ව. 900 සිට වර්තමානය දක්වා ය. භාෂාවෘත්ති, රූපාවතාරය, රූපමාලාව, සිද්ධාන්තකෞමුදී හා සාරස්වත ව්‍යාකරණය මේ යුගයට අයත් වේ.

## 4. පාණිනී හා අෂ්ටාධ්‍යායී

සකු වියරණයේ අතිසම්භාවනීය ග්‍රන්ථය වූකලී පාණිනීය හෙවත් අෂ්ටාධ්‍යායීය යි. ඉන්දු ආර්ය ජනයා ව්‍යවහාර කළ දෛවී භාෂාව සංස්කෘත නමින් අභිවර්ධනය

කිරීමේ ගෞරවය පාණිනි ව්‍යාකරණඥයාට හිමි වේ. බ්ලූම්ෆීල්ඩ් නම් අමෙරිකානු ජාතික වාග්විද්‍යාඥයා විසින් මානව ශිෂ්ටාචාරයේ විශිෂ්ටතම සිහිවටනය, මානව බුද්ධියේ උසස් ම ස්මාරකයක් (The greatest monument of the human civilization'' "a monumental work of Human intelligence)[17] ලෙසින් හඳුන්වන මෙම අෂ්ටාධ්‍යායීය ක්‍රි. පූ. 600-300 දී පමණ සම්පාදනය විණි.[18] සම්භාව්‍ය සංස්කෘත භාෂාව වෛදික භාෂාවෙන් වෙනස් වුණු භාෂාවක් වශයෙන් ප්‍රතිෂ්ඨාපිත වූයේ පාණිනි ව්‍යාකරණය සම්පාදනය වීමෙන් පසුව යි. ඇමරිකානු වාග්විද්‍යාවේ පියා ලෙසින් සැලකෙන බ්ලූම්ෆීල්ඩ් වැනි නූතනයන් පවා විමතියට පත් කරවන තරමේ ශබ්දවිද්‍යාව හෙවත් වාග්විද්‍යාත්මක වූ උච්චාරණ විධි, ශබ්ද පරිණාමය වැනි තොරතුරු සම්භාරයක් අන්තර්ගත අෂ්ටාධ්‍යායීය "ශබ්දානුශාසන" නම් අන්වර්ථ වූ පර්යායකින් ද හැඳින්වේ.

පාණිනීගේ රචනාවන්හි පෞද්ගලික තොරතුරු අප්‍රකාශිත බැවින් ඔහු විසූ කාලය අවිශද ය. ඔහුගේ ජීවන තොරතුරු කීත් මෙලෙසින් සංක්ෂිප්ත ලෙස දක්වයි. ''අවාසනාවකට මෙන් පාණිනීගේ දිනවකවානුව අවිනිශ්චිත ය. මොහු යාස්ක හා ශෞනකට පසු ව විසූවෙකි.... වර්තමානයේ අතක් ප්‍රදේශයෙහි ශලාතුර ගමෙහි වැසියකු බව අපි දනිමු. ඔහු සිහි කිරීම් වස් තනා තිබූ ප්‍රතිමාවක් හියුං සාං දුටුවේ මෙහි ය. ඔහුගේ මව දාක්ෂී නම් වූවා ය.''[19] පතඤ්ජලීගේ මහාභාෂ්‍යයෙහි පාණිනී හඳුන්වා ඇත්තේ දාක්ෂීපුත්‍ර නමිනි. එමඟින් ඔහුගේ මව දාක්ෂී බව පැහැදිලි වේ. පඤ්චතන්ත්‍රයේ සඳහන් වන **"සිංහො ව්‍යාකරණස්‍ය කර්තෘරහරත් ප්‍රාණාන් ප්‍රියාන් පාණිනෙ"** යන ශ්ලෝකාර්ධයට අනුව සිංහයකු විසින් පාණිනී මරණයට පත් කළ බව දැක්වේ. පාණිනී විසින් කළ වෙනත් සාහිත්‍ය නිර්මාණ දෙකක් පිළිබඳ රාජසේඛරගේ සූක්තිමුක්තාවලියෙහි සහ රුද්‍රටගේ කාව්‍යාලංකාර විචාරයක සඳහන් වේ. ඒ ජාම්බවතී විජය සහ පාතාල විජය යන කාව්‍යද්වයක් පිළිබඳ ව ය. පාණිනීය ශික්ෂා සහ ද්විරූපකෝෂ පාණිනීගේ සෙසු කෘති වේ.

පාණිනීගේ උත්කෘෂ්ට රචනාව අෂ්ටාධ්‍යායී ව්‍යාකරණය යි. මෙහි සංස්කෘත ව්‍යාකරණය මෙන් ම වෛදික ව්‍යාකරණය ද ඇතුළත් වේ. මෙම කෘතියට අෂ්ටක, අෂ්ටාධ්‍යායී, ශබ්දානුශාසනා හා වෘත්තිසූත්‍ර යන නාම ව්‍යවහෘත ය.

මෙය අධ්‍යාය (පරිච්ඡේද) 8 කින් පරිමිත ව රචිත බැවින් අෂ්ටාධ්‍යායී නම් වේ. එහි දක්නට ලැබෙන සමකාලීන වියරණ ඇදුරන් 64 දෙනකු පිළිබඳ සටහන දියුණු වියරණ ශාස්ත්‍රයක් පිළිබඳ හැඟීමක් අප වෙත ළඟා කරන අතර ම පාණිනීයේ විශිෂ්ට සාරවත් බවට හේතු ද ප්‍රකාශ කරයි. සම්භාව්‍ය සංස්කෘත භාෂාව වෛදික භාෂාවෙන් වෙනස් වුණු භාෂාවක් වශයෙන් ප්‍රතිෂ්ඨාපිත වූයේ පාණිනී ව්‍යාකරණය සම්පාදනය වීමෙන් පසුව යි.

පාණිනීය ව්‍යාකරණයේ එක් එක් අධ්‍යාය පාද 4 කට බෙදා ඇත. එහි සම්පූර්ණ සූත්‍ර සංඛ්‍යාව 3997 කි. එහි අන්තර්ගතය සම්බන්ධ තොරතුරු ඉතා සංක්ෂිප්ත ව මෙලෙස දැක්විය හැකි ය.

i. සංඥා, ප්‍රත්‍යාහාර, පරිභාෂා, පරස්මෛපද හා ආත්මනේපද ප්‍රක්‍රියාව, රීති හා කාරක (චතුර්ථී) (ව්‍යාකරණය පිළිබඳ සංඥා නාම සහ ඒවායේ අර්ථ නිරූපණය පිළිබඳ නීති). මෙහි සූත්‍ර 351 කි.

ii. සමාස, විභක්ති හා කාරක (තෘතියා, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී) (නාමයන් තැනීම හා විභක්තීන්ගේ යෙදීම්). මෙහි සූත්‍ර 268 කි.

iii. කෘත්‍ය හා කෘත් ප්‍රත්‍යය (ධාතුවලට ප්‍රත්‍යයන් එකතු කරන ආකාරය). මෙහි සූත්‍ර 631 කි.

iv. තද්ධිත ප්‍රභේද (නාම මූලයනට ප්‍රත්‍යය එක් කිරීම). මෙහි සූත්‍ර 635 කි.

v. තද්ධිත ප්‍රභේද (නාම මූලයනට ප්‍රත්‍යය එක් කිරීම). මෙහි සූත්‍ර 555 කි.

vi. තිබන්ත සන්ධි ස්වර හා අංගාධිකාරයේ ආරම්භය, උච්චාරණ විධි හා ශබ්ද පරිණාමය (පද සාධනයෙහි සිදු වන උච්චාරණයේ හා ශබ්ද ලක්‍ෂණයන්ගේ වෙනස්කම්). මෙහි සූත්‍ර 736 කි.

vii. අංගාධිකාරය (උච්චාරණ විධි හා ශබ්ද පරිණාමය). මෙහි සූත්‍ර 438 කි.

viii. ද්විරුක්ත ස්වර ප්‍රක්‍රියා, සන්ධි ප්‍රකරණ, ෂත්ව, ණත්ව වැනි වාක්‍ය ප්‍රයෝග (වාක්‍යයක පද යෙදීම කළ යුතු ආකාරය). මෙහි සූත්‍ර 369 කි.

ඉහත පරිදි සූත්‍ර එකතුව 3983 කි. මීට අමතරව මහේශ්වර සූත්‍ර නමැති සූත්‍ර 14ක් එකතු වී සම්පූර්ණ සූත්‍ර ගණන 3997 ක් බවට පත් වේ.

පැරැණි වෛදික ව්‍යාකරණ පද්ධතියෙහි වූ රූපබාහුල්‍යය පාණිනී අතින් සරලීකරණයට ලක් විය. වෛදික භාෂාවේ භාවිත ඇතැම් විභක්ති ප්‍රත්‍යය ද පූර්වක්‍රියා රූප ද පාණිනී විසින් අත්හැර දැමුණු අතර ඇතැම් ආඛ්‍යාත හා ලකාර දැඩි සංස්කරණයකට භාජනය විය. මේ හේතුවෙන් ලෞකික හෙවත් සම්භාව්‍ය සංස්කෘතය ලේට් ලකාරය භාවිතයෙන් තොර විය. පාණිනී ව්‍යාකරණයේ මූලික සිද්ධාන්තය වූයේ සියලු ම නාමපද ක්‍රියාපදවලින් ප්‍රභවය වූ බව යි. මෙහි කැපී පෙනෙන තවත් ලක්ෂණයක් වන්නේ එහි විද්‍යමාන සංක්ෂිප්ත භාවය යි.

**4.2. අෂ්ටාධ්‍යායීය අනුව යන ව්‍යාකරණ කෘති**

පාණිනිය අනුගත සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථ සමූහයක් ම අපට හමු වෙයි. එහිදී පාණිනීය ව්‍යාකරණය මුල් කොට රචිත පරිකථා මෙන් ම ස්වාධීන ව රැසැයුණු ව්‍යාකරණ ග්‍රන්ථ ද දැකිය හැකි ය. මේ ග්‍රන්ථ සංස්කෘත ව්‍යාකරණ සාහිත්‍යයේ දෙවැනි යුගයට අයත් ය.

**4.2.1. වෘත්ති හෙවත් භාෂ්‍ය**

කාත්‍යායන යනු භාෂ්‍ය රචකයෙකි. පරිකථාකරුවෙකි. පාණිනීගේ අෂ්ටාධ්‍යායී ව්‍යාකරණයේ එන සූත්‍ර 1245 කට වාර්තිකා නොහොත් පරිකථා සැපයූ කාත්‍යායන ක්‍රි. පූ. 3 වන ශතවර්ෂයේ ඩෙකෑන් ප්‍රදේශයේ විසූවෙකි.

පතඤ්ජලී පාණිනීය ව්‍යාකරණයට භාෂ්‍ය ලියූ කෙනෙකි. ඔහු ලියූ ග්‍රන්ථය වන්නේ මහාභාෂ්‍යය හෙවත් මහා අටුවාව යි. එහි පුෂ්‍යමිත්‍ර නම් සුංග රජතුමා ගැන හා ග්‍රීක ආක්‍රමණයන් ගැන සඳහන් වන නිසා පතඤ්ජලී ක්‍රි. පූ. දෙවන සියවසට අයත් වේ යැයි විචාරක මතය යි. පාණිනී සූත්‍ර පිළිබඳ ව එතෙක් ලියැවී තිබුණු සියලු ම විචාරාත්මක සටහන් ගොනු කොට ඊට තවත් සටහන් එකතු කොට මහාභාෂ්‍යය සම්පාදිත ය. මෙහි පාණිනී සූත්‍ර 1713 ක් විමර්ශනයට ලක් කොට ඇත්තේ සංවාද ස්වරූපයෙනි. පතඤ්ජලී සිය කෘතිය සම්පාදනයේදී කාත්‍යායනගේ වාර්තිකා හැරුණු කොට වෙනත් ව්‍යාකරණ ග්‍රන්ථ ගණනාවක් ද පරිශීලනය කර ඇතැයි පෙනෙයි. එම පැරණි ව්‍යාකරණ ග්‍රන්ථකාරයන් අතර ව්‍යාඩි, වාජප්‍යායන, පෞෂ්කරසාදි, ගොණිකාපුත්‍ර ආදි නම් දක්නා ලැබේ.

පතඤ්ජලීගේ මහාභාෂ්‍යයේ ඇති වැදගත්කම හා සමහර තැන්හි වූ දුරවබෝධ භාවය නිසා පසුකාලීන ව සිටි අය ද භාෂ්‍ය සැපයීමට උත්සුක වී ඇත. ක්‍රි. ව. 7 වන ශතවර්ෂයේ විසූ භර්තෘහරීන්ගේ **වාක්‍යපදීය** හෙවත් වාක්‍යයක පදයන් පිළිබඳ අනුශාසනාව එවැනි වැදගත් භාෂ්‍යයකි. ක්‍රි. ව. 650 පමණ රචිත **කාශිකාවෘත්තිය** පාණිනී ව්‍යාකරණයට ලියැවුණු තවත් වැදගත් භාෂ්‍යයකි. එහි කාණ්ඩ 8 කි. පළමු කාණ්ඩ 5 ජයාදිත්‍ය විසින් ද සෙසු කාණ්ඩ 3 වාමන විසින් ද ලියා ඇත. මෙය මහාභාෂ්‍යයට වඩා කුඩා ය. මෙහි සංක්ෂිප්තතාව හා පැහැදිලි බව අතිප්‍රශස්ත ය. පාණිනී සූත්‍ර සියල්ල ම විමසුමට භාජනය කළ පැරණිතම භාෂ්‍ය ග්‍රන්ථය වශයෙන් මෙයට විශේෂ තැනක් හිමි වේ. ක්‍රි. ව. 650 දී පමණ ම පාණිනී ව්‍යාකරණයට සැපයුණු ව්‍යාඛ්‍යාවක් **බරණැස් අටුවාව** යන අන්වර්ථ නාමයෙන් හැඳින්වේ. මෙය අධ්‍යාය 8 කින් පරිපූර්ණ ය. පළමු අධ්‍යාය පහ ජයාදිත්‍ය විසින් සම්පාදිත අතර අවසන් අධ්‍යාය තුන වාමන අතින් සම්පාදිත ය. මහාභාෂ්‍යයට වඩා අතිශය ලුහුඬු වුව ද සැම සූත්‍රයක් ම පැහැදිලි කරමින් පාණිනී ව්‍යාකරණයට සම්පාදිත පැරණි ම පරිකථාවක් ලෙස මෙය වැදගත් ය. සූත්‍ර පැහැදිලි කිරීමට භාවිත නිදර්ශන සියල්ල ම උපුටාගෙන ඇත්තේ පැරණි අර්ථකථාචාර්යවරුන්ගේ කෘතිවලිනි.

## 5. ස්වාධීන ව්‍යාකරණ කෘති

පාණිනී ව්‍යාකරණ සූත්‍රවල ඇති අතිසංක්ෂිප්ත භාවය හා දුරවබෝධ භාවය දුරු කොට ඒවා වඩා පහසුවෙන් අවබෝධ කරගැනීම පිණිස අෂ්ටාධ්‍යායී කෘතිය වඩාත් ප්‍රායෝගික වන ආකාරයට සංස්කරණය කිරීමට පසුකාලීන ව්‍යාකරණකරුවෝ උත්සුක වූහ. ක්‍රි. ව. 15 වන සියවසේ විසූ රාමචන්ද්‍ර ඔවුන් අතුරින් ප්‍රමුඛයා වේ. ඔහු විසින් **ප්‍රක්‍රියාකෞමුදී** නම් ග්‍රන්ථය ලියන ලදි. එය පාණිනී ව්‍යාකරණයෙහි එන රීති වඩා ව්‍යවහාරෝචිත නම්‍ය ක්‍රමයකට අනුව පෙළ ගැස්වීමකට දරන ලද උත්සාහයකි. ක්‍රි. ව. 17 වන සියවසේ විසූ භට්ටෝජි දීක්ෂිත විසින් **සිද්ධාන්තකෞමුදීය** (සිදත් සඳරැස) රචිත ය. භාරතීයන් අතර ජනප්‍රිය වූ එය පාණිනී සූත්‍ර වඩාත් ස්වාභාවික ආකාරයෙන් ඉදිරිපත් කිරීමකි. පසුව එය තවදුරටත් සංක්ෂිප්ත කොට **ලඝුසිද්ධාන්තකෞමුදී** (සිදත් ලුහු සඳරැස) නම් කෘතිය රචනා කරන ලද්දේ වරදරාජ දීක්ෂිත විසිනි.

මේ යුගයට අයත් කෘති සමුදාය සම්බන්ධ තොරතුරු පහත පරිදි වගුවකින් දැක්විය හැකි ය.

| ග්‍රන්ථය | කර්තෘ | කාලය |
|---|---|---|
| කාත්‍යායනවෘත්ති | කාත්‍යායන | 2 සියවස |
| මහාභාෂ්‍යය | පතඤ්ජලී | 4 සියවස |
| කාශිකාවෘත්ති | වාමන-ජයාදිත්‍ය | 7 සියවස |
| න්‍යාසටීකා | ජිනෙන්ද්‍ර බුද්ධි | 7 සියවස |
| භාෂා වෘත්ති | පුරුෂෝත්තම දෙව | |
| රූපාවතාර | ධර්මකීර්ති හිමි | 12 සියවස |
| රූපමාලා | විමල සරස්වතී | 14 සියවස |
| සිද්ධාන්තකෞමුදී | භට්ටෝජි දීක්ෂිත | 17 සියවස |
| ලඝුසිද්ධාන්තකෞමුදී | වරදරාජ භට්ටාචාර්ය | |
| මධ්‍යසිද්ධාන්තකෞමුදී | වරදරාජ දීක්ෂිත | |
| ගණවෘත්ති | ක්ෂීර ස්වාමි | |
| උණාදි සූත්‍ර | ශාකටායන | |
| උණාදි වෘත්ති | උජ්ජ්වලදත්ත | |

## 6. අෂ්ටාධ්‍යායී සම්ප්‍රදායෙන් බැහැර වූ කෘති

පාණිනී ව්‍යාකරණ සම්ප්‍රදායෙන් බැහැර වූ පශ්චාත්කාලීන ව්‍යාකරණඥයෝ කිහිප දෙනෙක් ද වෙති. ව්‍යාකරණ විෂයයට අදාළ ව වැදගත් කරුණු කිසිවක් අලුතින් ගෙනහැර දැක්වීමට අපොහොසත් වීම නිසා ඔවුන්ගේ කෘති එතරම් වැදගත් කොට නො සැලකිණ. ඒවා අසම්පූර්ණ ද වෙයි. වඩා ජනප්‍රිය ශෛලියකින් තම අදහස් ඉදිරිපත් කිරීම එම කෘතිවල පරමාර්ථය විය. වෛදික ව්‍යාකරණ රූප පිළිබඳ කොටස් සම්පූර්ණයෙන් ම අත්හැර දැමීම එම ග්‍රන්ථවල එන ප්‍රකට අඩුපාඩුවකි.

මේ යුගය නියෝජනය කරමින් චන්ද්‍ර නම් ව්‍යාකරණඥයා ක්‍රි. ව. 650 දී පමණ **චාන්ද්‍ර ව්‍යාකරණය** ලිවී ය. දෙවන ශාකටායන ඊට පසු කලෙක විසූ ව්‍යාකරණඥයෙකි. ක්‍රි. ව. 12 වන සියවසේ විසූ හේමචන්ද්‍ර විසින් **ශබ්දානුශාසනය** ලියන ලදි. එය අධ්‍යාය 8 කින් පරිමිත ය. 1 සිට 7 දක්වා අධ්‍යායවල සංස්කෘත ව්‍යාකරණයත් 8 වැන්නෙහි මහාරාෂ්ට්‍රී, ශෞරසේනී, මාගධී, පෛශාචි, චූලිකා, පෛශාචි හා අපභ්‍රංශ යන ප්‍රාකෘත භාෂා 6 ක ව්‍යාකරණත් ඉගැන්වේ. සංස්කෘත භාෂාව ප්‍රකෘතිය බවත් ප්‍රාකෘත යනු එයින් භින්න වූ භාෂාවක් බවත් කියන හේමචන්ද්‍ර සියලු ම ප්‍රාකෘත භාෂා තත්භව, තත්සම හා දේශීය වශයෙන් කොටස් 3 කටත් බෙදා දක්වයි (**ප්‍රකෘති සංස්කෘතම් තත්‍රභවං තත ආගතං වා ප්‍රාකෘතම්**).

පසුකාලීන ව්‍යාකරණ ග්‍රන්ථ අතුරින් සංස්කෘත භාෂාවේ ප්‍රවර්ධනයට වැඩියෙන් ඉවහල් වූයේ සර්වවර්මන් විසින් සම්පාදිත **කාතන්ත්‍රය** යි. මෙය සාතවාහන රජුගේ ඇරයුමින් කුමාරයකුට ව්‍යාකරණය ඉගැන්වීමට ලියන ලද්දකි. **කෞමාරව්‍යාකරණ** යන අන්වර්ථ නාමය යෙදීමෙන් ද එය පැහැදිලි වේ. සන්ධි, නාම, ආඛ්‍යාත හා කෘත යනුවෙන් එහි කොටස් හතරක් දක්නා ලැබේ. 13 වන සියවසට අයත් වෝපදේවගේ **මුග්ධබෝධය** බෙංගාලයේ භාවිත ව්‍යාකරණ කෘතියකි. මෙම වකවානුවට අයත් අවසාන ව්‍යාකරණය වන්නේ සරස්වතී සූත්‍ර හෙවත් සාරස්වත ව්‍යාකරණය යි. සංක්ෂිප්ත ව හා පැහැදිලි ව සම්පාදිත මෙය ශ්‍රී ලංකාවේ ප්‍රාචීන භාෂා විද්‍යාර්ථීන් අතර ජනප්‍රිය ව්‍යාකරණයකි.

## 7. සාරස්වතය

සාරස්වතය යනු සංස්කෘත ව්‍යාකරණය සරල ව සංක්ෂිප්ත ව ක්‍රමානුකූල ලෙස ඉගෙනීමට ඉවහල් කෘතියකි. පාණිනී ව්‍යාකරණය සූත්‍ර 4000 කින් ද කාතන්ත්‍රය සූත්‍ර 1400 කින් ද පරිමිත වන අතර ඒවායෙහි අන්තර්ගතය විශාල බැවින් අවබෝධයට දුෂ්කර විය. ඒ නිසා ඊට වඩා සරල වූත් විශාල නොවූත් සාරස්වත ව්‍යාකරණය අනුභූති ස්වරූපාචාර්යයන් විසින් 13 වන ශතවර්ෂයේදී සම්පාදිත බව සැලකෙයි.

ස්වරූපාන්තෝ'නුභූත්‍යාදිඃ ශබ්දෝ'භූද්‍යත්‍ර සාර්ථකඃ

ස මස්කරී ශුභාං චක්‍රෙ ප්‍රක්‍රියාං චතුරොචිතාම්[20]

"ස්වරූප යන්න අන්ත කොට ඇති අනුභූති යන වචනය ආදි කොට ඇති අනුභූති ස්වරූප යන ශබ්දය යමෙකු කෙරෙහි අර්ථ සහිත වී ද, ඒ පරිබ්‍රාජක තෙමේ පණ්ඩිතයන්ට සුදුසු වූ සාරස්වත ප්‍රක්‍රියාව ඍජු කළේ ය හෙවත් ස්ථිරත්වයට පත් කළේ ය."

ප්‍රත්‍යක්ෂය, අනුමිතිය, උපමිතිය හා ශාබ්ද යන සිව්වැදෑරුම් නුවණ අනුභූති නම් වේ. එම අනුභූතිය ස්වරූප කොට ඇති තැනැත්තා අනුභූති ස්වරූප නම්. 'ශ්‍රීමත් පරම හංස පරිබ්‍රාජකාචාර්ය' යන විශේෂ නාමයකින් ද 'නරේන්ද්‍රාචාර්ය' යන අපර නාමයකින් ද හැඳින්වෙන මෙතුමා මස්කරින් නම් තාපසයෙකි. මස්කර යනු ද නුවණ යි. නුවණ ඇති තැනැත්තා මස්කරින් යනු වේ.

සාරස්වතය රචනා වීම සම්බන්ධ ජනප්‍රවාදයක් ද පවතියි. දිනක් පණ්ඩිත සභාවකදී අනුභූති ස්වරූපාචාර්යයන් විසින් ප්‍රකාශිත 'පුංක්ෂු' යන පදය ඇසූ වෙනත් පඬිවරුන් එවැනි පදයක් ව්‍යාකරණානුකූල ව සිද්ධ කළ නොහැකි බව ප්‍රකාශ කළහ. එසේ කළ හැකි බව ඔප්පු කරන මෙන් කරන ලද අභියෝගය භාරගෙන නිවසට ගිය අනුභූති ස්වරූපාචාර්යතුමා සරස්වතිය පුදා නිදාගත්තේ ය. සිහිනෙන් ඔහු වෙත පැමිණි සරසවිය පුංක්ෂු යන පදය සිද්ධ කිරීමට අවැසි "අසම්භවෙ පුංසඃ කක්ෂෞ" යන සූත්‍රය ද ඇතුළු ව සූත්‍ර 700 ක් කියා අතුරුදහන් වූවා ය. වාදය දිනූ පසුව අනුභූති ස්වරූපාචාර්යතුමා සරසවිය කියාදුන් සූත්‍ර 700 ට වෘත්ති හා උදාහරණ ලියා සාරස්වත ව්‍යාකරණය ස්ථිර තත්ත්වයට පත් කෙළේ ය.

**සරස්වත්‍යා ඉදම් සාරස්වතම්** - සරස්වතිය විසින් ප්‍රකාශ කරන ලද සූත්‍රවලින් යුක්ත ව්‍යාකරණය සාරස්වතය යි. මෙය සූත්‍ර 700 කින් පරිමිත වේ. **සාරස්වතී ප්‍රක්‍රියාව** යනු විශේෂ නාමයකි. ප්‍රකෘතිය - ප්‍රත්‍යය යනාදිය වෙන් කොට පද සිද්ධ කරගැනීම කරන නිසා එනමින් හැඳින්වේ. සරස්වතිය විසින් ප්‍රකාශිත සූත්‍ර 700 සූත්‍ර පාඨ නමින් ද වෘත්ති, උදාහරණ සහිත විස්තර සාරස්වතී ප්‍රක්‍රියා නමින් ද හැඳින්වේ.

වෘත්ති තුනක් යටතේ මෙහි කරුණු දැක්වේ. ප්‍රථම වෘත්තියේ සංඥා, සන්ධි, (ස්වර, ප්‍රකෘතිභාව, ව්‍යඤ්ජන, විසර්ග) නාම හෙවත් ලිංග - ස්වරාන්ත, හසන්ත, යුෂ්මත් හා අස්මත්, ස්ත්‍රී ප්‍රත්‍ය, කාරක, සමාස හා තද්ධිත යන කොටස් ඇතුළත් වේ. භ්වාදි දශගණයට අයත් ක්‍රියා සිද්ධිය, දශලකාර ප්‍රක්‍රියා සිද්ධිය, නාමධාතු ප්‍රක්‍රියා, ආත්මනේ පද, භාවක්‍රියා ආදිය ද්විතීය වෘත්තියට අයත් වේ. කර්තෘ අර්ථ, නිෂේධාර්ථ, ශීලාර්ථ, උණාදි, භාව, කෘත්‍ය, ස්ත්‍රී ආදි කෘදන්ත ප්‍රභේද තෘතීය වෘත්තියෙහි ඇතුළත් ය.

'ශබ්දවාරිද'[21] ලෙසින් පෞරාණික වාග්වේදීන් විසින් හඳුන්වන්ට යෙදුණු ශබ්දශාස්ත්‍රය හෙවත් ව්‍යාකරණය පිළිබඳ සංස්කෘතයෙන් සම්පාදනය වුණු ප්‍රමාණයෙන් ද සුවිසල් කෘතීන් අති විශාල ප්‍රමාණයකි. මෙහි දැක්වුනේ ඒ පිළිබඳ අතිසංක්ෂිප්ත, තොරතුරු ස්වල්පයක් පමණි.

## ආන්තික සටහන්

1 *බාලාවබෝධනය*, සීලක්ඛන්ධ හිමි, සී. ඒ.(සංස්. 1924) අලුත්ගම. විඥාපනය i පිට.

2 Monier, M. – Williams (2008, Eighth) *Sanskrit English Dictionary*, Munshiram Manoharlal Publishers, New Delhi. 1035p.

3 https://www.yumpu.com/en/document/view/16337202/*dictionary-of-sanskrit-grammar*. 377p.

4 *Shabdastoma Mahanidhi*, 1893. Kolkota, Bhattacarya, Jiwananda. 383p.

5 *පඤ්චතන්ත්‍රය*, මිත්‍රභේද කථා, සුමංගල හිමි, පහමුනේ. (සංස්. 1990) සමයවර්ධන, කොළඹ. (කථාමුඛය, 09 ශ්ලෝකය) 02 පිට.

6 - එම - 02 පිට.

7 *බාලාවබෝධනය*, සීලක්ඛන්ධ හිමි, සී. ඒ.(සංස්. 1924) අලුත්ගම. විඥාපනය vi පිට.

8 *Moggallana pancika* tika from Chattha Savgayana (CS)2550 B.E. (2006 A.D.) Released by Dhammavassarama "Yo niruttim na sikkheyya, sikkhanto pitakattayam; Padepade vikavkheyya, vane andhagajo yathati." 08p

9 තිලකසිරි, ජේ. (2007 ද්විතීය) *සංස්කෘත කාව්‍ය සාහිත්‍යය*. ගොඩගේ කොළඹ. 209 පිට.

10 තිලකසිරි, ජේ. (2014 පුනර්) *වෛදික සාහිත්‍යය*, ගොඩගේ, කොළඹ. 129 පිට.

11 තිලකසිරි, ජේ. *සං. කාව්‍ය සාහිත්‍යය*, 209 පිට.

12 තිලකසිරි, ජේ. *සං. කා. සා.* 209 පිට.

13 සේනානායක, ජී. එස්. බී. (1960 ද්විතීය) *සංස්කෘත සාහිත්‍යය*, ගුණසේන කොළඹ. 537 පිට.

14 *Kavikalpadruma of Vopdeva*, Edited By Palsule, G. B. (1954) Poona. 01p.

15 සේනානායක, 536 පිට.

16 ජයසේකර, ආනන්ද සහ චිත්‍රා.(1970) *තුලනාත්මක වාග්විද්‍යාව*, ලේක්හවුස්, කොළඹ. 190පිට.

17 Bloomfield, L. *Language*, Newyork, 1933

18 සේනානායක, ජී. එස්. බී. (1960 ද්විතීය) *සංස්කෘත සාහිත්‍යය*, ගුණසේන කොළඹ. 267 පිට.

19 කීත්, ඒ. බී. *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* (පරි. ජී. එස්. බී. සේනානායක - 1965) ගුණසේණ, කොළඹ. 644 පිට.

20 ධම්මින්ද හිමි, හෑගොඩ. (1944) *විස්තරාර්ථ සහිත සාරස්වත ප්‍රක්‍රියා ව්‍යාඛ්‍යානය* (උපරිම භාගය) විද්‍යාතිලක, කළුතර. 418 පිට.

21 *සාරස්වත සංඥා කාණ්ඩය*, ii පද්‍යය.